මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2025

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය -10 ශ්‍රේණිය

I පත්‍රය කාලය : පැය02

උපදෙස් :

- සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න .
- 01 සිට 40 තෙක් ප්‍රශ්න වලදී වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න .
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ කතිර (x) ලකුණක් යොදන්න.

---

01 සන්නිවේදනය පිළිබද ගණිතමය ආකෘතිය සකස් කිරීමට වොරන් වීවර් සමග එක්ව කටයුතු කළ පුද්ගලයා

(1) ක්ලෝඩ් ෂැනොන් ය. 3) හැරල් ඩී ලැස්වෙල් ය.
(2) විල්බර් ශ්‍රාම් ය. (4) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් ය.

02 ලැස්කෝ හා ඇල්ටමීරා ගුහා චිත්‍ර අයත් වන්නේ ,

(1) ලිඛිත සන්නිවේදනයට ය. (3) අවාචික හා ලිඛිත සන්නිවේදනයටය .
(2) දෘශ්‍ය සන්නිවේදනයටය. (4) අවාචික හා දෘශ්‍ය සන්නිවේදනයටය .

03 දකුණේ සිට වමට ලේඛණයේ යෙදෙන භාෂාව වන්නේ ,

(1) සිංහල භාෂාව (3) අරාබි භාෂාව
(2) හින්දි භාෂාව (4) චීන භාෂාව

04 ප්‍රදීපාගාර උපක්‍රමය වඩාත් සුදුසු වන්නේ ,

(1) ජන සන්නිවේදනයටය . (3) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයටය.
(2) සමූහ සන්නිවේදනයටය . (4) පුද්ගලාන්තර සන්නිවේදනයටය.

05 " කෙනෙකුගේ පංචේන්ද්‍රය මගින් ලැබෙන විවිධ සංදේශ ග්‍රහණය කරගෙන එය තේරුම් ගැනීම"හඳුන්වන්නේ ,

(1) සංජානනය ලෙසය . (3) සන්නිවේදනය ලෙසය.
(2) සහවේදනය ලෙසය. (4) සහනාභූතිය ලෙසය .

06 ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද පළමුවන සිංහල මාධ්‍ය පුවත්පත වන්නේ ,

(1) කවට කතිකයාය. (3) ලක්මිණි පහනය.
(2) ලංකාලෝකයි. (4) කලම්බු ජර්නලය

07 ශ්‍රී ලංකාවේ ප්‍රථම රූපවාහිනී සේවාව වනුයේ ,

(1) ස්වර්ණවාහිනී නාලිකාව (3) ජාතික රූපවාහිනිය
(2) ස්වාධීන රූපවාහිනිය (4) සිරස නාලිකාවයි.

08 භාෂාවේ මූලික කාර්යයක් නොවන්නේ ,

(1) කාලය සන්නිවේදනය (3) සිතීම හදුනාගැනීම
(2) සැබෑව හදුනාගැනීම (4) කථන රටා පුහුණු කිරීම

09 මුලින්ම සෑම පුද්ගලයෙකුම සන්නිවේදකයකු බවට පත් වන්නේ ,

(1) ජන සන්නිවේදනයේදීය .
(2) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේදීය.
(3) අන්තර් පුද්ගල සන්නිවේදනයේදීය .
(4) සමූහ සන්නිවේදනයේදීය .

10 ට්සායි ලුන් ,ජොහැන්නස් ගුටෙන්බර්ග් ,ග්‍රැහැම්බෙල් , මාකෝනි විසින් සොයාගත් දෑ පිළිවෙලින් වන්නේ,

(1) කඩදාසිය,පුවත්පත ,ගුවන්විදුලිය,රූපවාහිනිය යි.
(2) කඩදාසිය,මුද්‍රණ යන්ත්‍රය , දුරකතනය , ගුවන් විදුලියයි.
(3) පුවත්පත,මුද්‍රණ යන්ත්‍රය ,ගුවන්විදුලිය, දුරකතනය යි.
(4) කඩදාසිය,පුවත්පත,රූපවාහිනිය, ගුවන් විදුලියයි.

11 සුදු හෝ වර්ණ පිටපතක් සුන්දර නිමාවකින් යුතුව ලබාගත හැකි වන්නේ,

(1) තිර මුද්‍රණ ක්‍රමයෙනි.
(2) ලේසර් මුද්‍රණ ක්‍රමයෙනි.
(3) ඩොට් මුද්‍රණ ක්‍රමයෙනි.
(4) ඉන්ජෙක්ටර් මුද්‍රණ ක්‍රමයෙනි .

12 වත්මන් ජනමාධ්‍ය වල නිවේදක නිවේදිකාවන් මිශ්‍ර භාෂා ශෛලියක් භාවිත කිරීම නිසා ඇති විය හැකි බාධාව වන්නේ ,

(1) පාරිසරික බාධා
(2) මාධ්‍ය බාධා
(3) තාක්ෂණික බාධා
(4) අර්ථ බාධා

13 රාජ්‍ය හිමිකම සහිත ගුවන් විදුලි නාලිකාවක් වන්නේ ,

(1) සියත FM
(2) ලක්හඬ ගුවන් විදුලිය
(3) සියත FM
(4) රංගිරි ශ්‍රී ලංකා

14 ඉතා ක්ෂණිකව තොරතුරක් දැන ගැනීමට භාවිතයට ගත හැකි හොදම ජනමාධ්‍ය ,

(1) රූපවාහිනිය
(2) දුරකථනය
(3) ගුවන්විදුලිය
(4) සමාජ ජාලා වෙබ් අඩවිය

15 ගුවන් තොටුපළින් පිටවන මගියෙකුගේ බෑගය තුළ කිසියම් හානිකර ද්‍රව්‍ය ඇත්දැයි පරීක්ෂාකර බැලීමට භාවිත කළ හැක්කේ ,

(1) විද්‍යුත් පිරික්සුම් උපකරණය මගිනි
(2) පේජරය මගිනි
(3) ඩිජිටල් කැමරාව මගිනි
(4)පිය වූ පටිපටි රූපවාහිනී කැමරාව මගිනි

16 දෘෂ්ටියේ අඛණ්ඩත්වයට අයත් නොවන අවස්ථාවකි ,

(1) ඔරලොසුවක කටු කරකැවීම
(2) විදුලි පංකාවක් ක්‍රියාත්මක වීම
(3) ගිණිබෝල කරකැවීම
(4) වාසනා චක්‍රය කර කැවීම

- 17 සිට 19 දක්වා ප්‍රශ්න වලට පහත පුවත්පත් උපයෝගී කර ගන්න

A - උදය තාරකෙ
B - ලංකා ලෝකය
C - දවස
D - ඥානාර්ථ ප්‍රදීපය
E - සිංහල බෞද්ධයා

17 කර්තෘ හිමිකාරීත්වය තිබූ පුවත්පත කුමක්ද ?

(1) C (2) B (3) A (4) D

18 මහජන සංවිධානවලට හිමි පුවත්පත් ඇතුළත් වරණය තෝරන්න.

(2) C ,D,E (2) B ,D,E (3) A,B,C (4) D,A,B

19 ශ්‍රී ලංකාවේ පුද්ගලික ව්‍යාපාරයක් වන එම්.ඩී ගුණසේන සමාගම විසින් මුද්‍රණය කළ පුවත්පත කුමක්ද ?

(3) C (2) B (3) A (4) D

20 මුද්‍රිත ප්‍රකාශනයක කල්පැවැත්ම තහවුරු කිරීමට අදාළ උපකරණය වන්නේ,

(1) ලේසර් මුද්‍රණ යන්ත්‍රයයි.
(2) පොත් බැඳුම් යන්ත්‍රයයි.
(3) ඩිජිටල් අනුපිටපත්කරණ යන්ත්‍රයයි.
(4) ලැමිනේටින් යන්ත්‍රයයි .

21 ප්‍රාථමික ශ්‍රේණිවල මාධ්‍ය ක්‍රියාව වඩාත් සාර්ථක කරගැනීමට යොදාගත හැකි ප්‍රක්ෂේපණ නොවන මාධ්‍ය උපකරණයකි .

(1) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය
(2) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපන යන්ත්‍රය
(3) පිටු පෙරලනය
(4) අන්තර් ක්‍රියාකාරී පුවරුව

22 පුවත්පතක අන්තර්ගත හා ව්‍යුහය සම්බන්දව නෛතික වගකීම පැවරී ඇත්තේ ,

(1) වාර්තාකරුවන්ටය
(2) ප්‍රධාන කර්තෘටය
(3) ප්‍රධාන උප කර්තෘටය
(4) නියෝජ්‍ය කර්තෘටය

23 එක් අයෙකු කේන්ද්‍ර කොටගෙන බොහෝ දෙනෙක් අතර පැතිර යන විධිමත් සන්නිවේදන ආකෘතිය වන්නේ ,

(1) දාම ආකෘතිය
(2) වයි ආකෘතිය
(3) රෝද ආකෘතිය
(4) චක්‍රීය ආකෘතිය

24 පුවත්පතක සිනමා හා නාට්‍ය පිටුව භාරව සිටින්නේ

(1)ප්‍රවෘත්ති කර්තෘ ය .
(2) ප්‍රධාන කර්තෘය .
(3) නියෝජ්‍ය කර්තෘ ය .
(4) විශේෂාංග කර්තෘ ය .

25 ආයතනයේ නම හා ජනමාධ්‍යයේ නම එකිනෙකට ගැළපෙන වරණය තෝරන්න .

(1) විජය ප්‍රකාශන -ඩේලි නිවුස්
(2) ලේක් හවුස් -සිළුමිණ
(3) රූපවාහිනී සංස්ථාව -වසන්තම්
(4) ගුවන් විදුලි සංස්ථාව -නෙත් FM

26 සාමාන්‍ය පෙළ වැඩමුළුවකට සහභාගි වූ දේශකයෙක් දේශනය කිරීමේදී වේදිකාවේ පමණක් නොසිට සිසුන් අතරටද ගොස් මයික්‍රෆෝනය භාවිතා කරමින් කථනයේ යෙදෙන ලදි.ඒ සඳහා ඔහු යොදා ගන්නට ඇත්තේ ,

(1) රැහැන් සහිත මයික්‍රෆෝනයකි .
(2) FM මයික්‍රෆෝනය.
(3) මෙගා ෆෝනයකි .
(4) ආධාරකයෙන් ඉවතට ගත් මයික්‍රෆෝනයකි .

27 කාර්යාලයක තැපැල් අංශය විසින් භාවිත කරන කාර්යාල උපකරණ දෙක ඇතුළත් වරණය තෝරන්න.

(1) දින මුද්‍රා යන්ත්‍රය හා තැපැල් මුද්‍රා යන්ත්‍රය
(2) පරිගණකය හා මුදල් ගණින යන්ත්‍රය
(3) ගණක යන්ත්‍රය හා මුදල් සටහන් යන්ත්‍රය
(4) නිල මුද්‍රාව හා මුදල් සටහන් යන්ත්‍රය

28 පාසලේ සාහිත්‍ය සංගමයේ දී දිලීපා ගැයූ මව් ගුණ ගීතය අසා සිටි සභාවේ ඇතමෙක් කඳුළු හෙලනු දුටුවේය. මෙහි දී ග්‍රාහකයා පසු කළ සන්නිවේදන ස්වරූප ,

(1) විධිමත් -ශ්‍රව්‍ය -අවාචික සන්නිවේදනය
(2) ශ්‍රව්‍ය -දෘශ්‍ය - අවිධිමත් සන්නිවේදනය
(3) ලිඛිත -වාචික -ශ්‍රව්‍ය සන්නිවේදනය
(4) වාචික- අවාචික -දෘශ්‍ය සන්නිවේදනය

29 පාසල් මාධ්‍ය සමාජය විසින් සමරනු ලබන ලෝක "සිනහ දිනය "සඳහා කතාවක් පැවැත්වීමට ඔබව තෝරාගෙන තිබේ .මෙය කවර සන්නිවේදන වර්ගයකට අයත් වේද ?

(1) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය
(2) සමූහ සන්නිවේදනය
(3) අන්තර්පුද්ගල සන්නිවේදනය
(4) ජනසන්නිවේදනය

30 ජීවදත්ත පත්‍රිකාවක් සැකසීමේ දී අනුගමනය නොකළ යුතු ක්‍රියාවකි.

(1) A4 කඩදාසි භාවිතා කිරීම.
(2) අනු මාතෘකා තද කළු අකුරින් ලිවීම .
(3) ආකර්ෂණීයව සකස් කිරීම .
(4) වර්ණ අකුරු /වර්ණ කඩදාසි භාවිතා කිරිම .

31 මාධ්‍ය ක්‍රියාකාරීත්වය කෙරෙහි රජයේ වක්‍ර මැදිහත්වීමක් වන්නේ ,

(1) ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීමයි.
(2) වාරණය කිරීමය.
(3) බලපත්‍ර ලබාදීමය.
(4) බදු පැනවීමයි.

32 දොරටු පාල සංකල්පය ක්‍රියාත්මක වීමට අවම ඉඩක් ඇත්තේ,

(1) යුධ සමයේ ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේදී ය.
(2) ස්වභාවික ව්‍යවසනයකින් මිය ගිය ජීවිත හානි හා දේපල හානි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේදීය.
(3) සංවර්ධන ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේදීය.
(4) චිත්‍රපට තිරගත කිරීමේදීය.

33 පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියකදී එහි රූප සටහන් හා ඡායාරූප ඇතුළත් කළ යුතු වන්නේ නම් ඒ සඳහා යොදාගත යුතු මෘදුකාංගයක් වන්නේ,

(1) ඇඩෝබ් පේජ්මේකර් මෘදුකාංගයයි.
(2) කොරල් ඩ්‍රෝ මෘදුකාංගයයි.
(3) ක්වැක් එක්ස්ප්‍රස් මෘදුකාංගයයි.
(4) ඇඩෝබ් ඉන්ඩිසයින් මෘදුකාංගයයි.

34 යම් තැනැත්තෙකු හෝ සංවිධානයක් හෝ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවි පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) වෙබ් අඩවි යනු, විද්‍යුත් තොරතුරු ඇතුළත් ගොනුවකි.
(2) ඕනෑම තැනක සිට අන්තර්ජාලය ඔස්සේ වෙබ් අඩවිවලට ප්‍රවේශ විය හැකිය.
(3) වෙබ් අඩවි වලට ප්‍රවේශ වීමට බොහෝ විට මුදලක් ගෙවිය යුතුය.
(4) වෙබ් අඩවි පවත්වාගෙන යාමට නියමිත මුදලක් ගෙවිය යුතුය.

35 ප්‍රක්ෂේපණය වන පන්ති කාමර මාධ්‍ය උපකරණ අතරින් විනිවිදක පත්‍ර භාවිත කළ හැකි උපකරණය කුමක්ද?

(1) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය
(2) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය
(3) අන්තර් ක්‍රියාකාරී පුවරුව
(4) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය

36 ශ්‍රී ලංකාවට ගුවන් විදුලිය හඳුන්වා දීමට පුරෝගාමී මෙහෙවරක් කරන ලදදේ,

(1) බොබ් ක්‍රිස්ටින් ය.
(2) එඩ්වඩ් හාපර්
(3) ජොන් රීත් සාමිවරයාය.
(4) මැනිං ආණ්ඩුකාරවරයා ය.

37 අත් පත්‍රිකා ,පෝස්ටර්, පොත් පිංච, බිත්ති පුවත්පත් සුලබව සන්නිවේදන කාර්යයේදී භාවිතා වේ.

(1) සාම්ප්‍රදායික ශබ්ද මාධ්‍යයන් ය.
(2) සාම්ප්‍රදායික දෘශ්‍ය මාධ්‍යයන් ය.
(3) නූතන ශබ්ද මාධ්‍යයන්ය.
(4) නූතන දෘශ්‍ය මාධ්‍යයන්ය.

38 නිල ලිපි ශීර්ෂයක් සහිත ලිපියක් ඒ ආකාරයෙන් ම ඉක්මනින් ම හා පහසුවෙන් තවත් ස්ථානයක් වෙත යැවිය හැකි වන්නේ ,

(1) ෆැක්ස් යන්ත්‍රය මගිනි.
(2) ඡායා පිටපත් යන්ත්‍රයක් මගිනි.
(3) විද්‍යුත් තැපැල මගිනි.
(4) ඩිජිටල් කැමරාවක් මගිනි.

39 යෝජනා පෙට්ටි පවත්වාගෙන යාම කුමන සන්නිවේදනයක් නිරූපිතද?

(1) පහළ සිට ඉහළ සන්නිවේදනය
(2) අන්තර් පුද්ගල සන්නිවේදනය
(3) කණ්ඩායම් සන්නිවේදනය
(4) ඉහළ සිට පහළට සන්නිවේදනය

40 විද්‍යුත් මාධ්‍ය වෙත ඉතා ඉක්මනින් ග්‍රාහක ප්‍රතිචාර ලබාදිය හැකි ක්‍රමය වන්නේ,

(1) කෙටි පණිවිඩ හා අන්තර්ජාලය භාවිතයයි.
(2) ලිපි හා විද්‍යුත් තැපැල භාවිතයයි.
(3) තැපැල් හා කෙටි පණිවිඩයයි.
(4) තැපැල් පත් හා සමාජ ජාලයයි.